# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2301/19 - 2022 ඔක්තෝබර් මස 10 වැනි සඳුදා - 2022.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී-බී. 21/1978 (X) බී

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවියයුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී.වී. 115017 දරන සහ අංක 495, මීනුවන්ගොඩ පාර, බෝලවලාන, මීගමුව යන ස්ථානයේ පිහිටා ඇති සමාගමක් වන බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේශන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2021 මාර්තු මස 23 වැනි දින අංක 2220/32 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව" යන සටහනට හා II වන තීරයේ එහි අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි I වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

I වන උපලේඛනය

**කොන්දේසි**

1. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේශන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි 6 වන ස්ථරයේ) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ සමාන සුදුසුකමක් සමග නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම,

යන ඇතුළත් කරගැනීමේ අවම සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේශන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සිදු කළ යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),**
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0086/1

---

එල්.ඩී-බී. 21/1978 (X) බී

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවියයුතු 27(1)(ආ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී.වී. 17745 දරන සහ මිලේනියම් ඩ්‍රයිව්, අයි. ටී. පාර්ක්, මාලඹේ 10115 යන ස්ථානයේ පිහිටි උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගනු ලබන, සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2022 අප්‍රේල් මස 21 වැනි දින අංක 2276/26 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ

විද්‍යාවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි 6 වන ස්ථරය) ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් වන උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී වාණිජ විෂයය ධාරාව යටතේ එකවර සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

   (ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවක් යටතේ එකවර සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය | බීබීඑම් ගෞරව (ගිණුම්කරණය) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),**
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0086/2

එල්.ඩී-බී. 21/1978 (X) බී

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවියයුතු 27(1)(ආ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී.වී. 72548 දරන සහ අංක 135, එස්. ඩී. එස්. ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ යන ස්ථානයේ පිහිටි උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගනු ලබන, සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 අගෝස්තු මස 17 වැනි දින අංක 2293/25 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

I වන උපලේඛනය

**කොන්දේසි**

1. සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි 6 වන ස්ථරයේ) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී වාණිජ විෂයය ධාරාව යටතේ එකවර සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

   (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවක් යටතේ එකවර සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් සමග නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| සංචාරක හා ආගන්තුක සත්කාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය | බීබීඑම් ගෞරව (සංචාරක හා ආගන්තුක සත්කාර) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),**
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0086/3

එල්.ඩී.-බී. 21/1978 (X) ඇ

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී.වී. 94125 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2020 ජනවාරි මස 06 වැනි දින අංක 2157/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ආචාර්ය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

I වන උපලේඛනය

**කොන්දේසි**

1. නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණ කළ යුතු ( SLQF 6 වන මට්ටම) තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේ දී ගෞරව උපාධිය සම්බන්ධයෙන් -

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම ; හෝ

   (ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (තොරතුරු තාක්ෂණය) |

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0086/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.